## අධ්‍යාපන සහ පුහුණු ක්ෂේත්‍රය
## (Education and Training Sector)

මග පෙන්වීම සහ පුහුණු කරවීම මෙම ක්ෂේත්‍රයේ නියැළෙන්නන්ගේ කාර්යයකි. ඔබට ගුරුවරයෙකු, උපදේශකයකු හෝ විදුහල්පතිවරයෙකු විය හැකි ය. ඔබට ක්‍රීඩා, ක්‍රියාකාරකම් පුහුණු කිරීමට හෝ ප්‍රජා සංවර්ධන කාර්යන්ට දායක විය හැකි ය. ඔබට වැඩිහිටියන් සමඟ ද වැඩ කළ හැකි ය. උදාහරණයක් වශයෙන් වෘත්තීය පුහුණුව ලබාදීම, උසස් අධ්‍යාපන ආයතනයක දේශකයකු ලෙස වැඩ කළ හැකි ය.

**අධ්‍යාපන සහ පුහුණු කේෂත්‍රය හා සම්බන්ධ රැකියා/ වෘත්ති,**

**1. ලේඛනාරක්ෂක**
ඓතිහාසික වශයෙන් වැදගත් වන ලේඛන සහ වාර්තා සංරක්ෂණය කිරීම.

**2. ශ්‍රව්‍ය දෘශ්‍ය සහ බහුමාධ්‍ය එකතු කිරීමේ විශේෂඥ**
අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා භාවිතා කිරීමට බහු මාධ්‍ය ඉගැන්වීම් ආධාරක ක්‍රියාත්මක කිරීම.

**3. ක්‍රීඩා පුහුණුකරු**
ආධුනික හෝ වෘත්තිය ක්‍රිඩක ක්‍රීඩිකාවන්ට උපදෙස් දීම. ක්‍රීඩාවේ මූලික කුසලතා ඔවුන්ට ඉගැන්වීම.

**4. පාසල් ගුරු**
පාසල්වල පවතින විෂයයන්ට අදාළව ඉගැන්වීම් කටයුතුවල වීම.

**5. අධ්‍යාපන පරිපාලක**
පාසල් හා අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනික සහ පරිපාලන කටයුතු සම්බන්ධීකරණය කිරීම.

**6. වෘත්තිය අධ්‍යාපන ගුරු/ උපදේශක**
වෘත්තීය පුහුණු අධ්‍යාපන ආයතනවල විෂයයන් ඉගැන්වීම.

**7. දුරස්ථ ඉගෙනුම් සම්බන්ධීකාරක**
දුරස්ථ ඉගෙනුම් වැඩසටහන් කළමනාකරණය කරන්නා.

**8. අධ්‍යාපන, වෘත්තීය සහ පාසල් උපදේශක**
පාසල් සහ වෘත්තීය සැලසුම් සකස් කිරීමට පුද්ගලයන්ට උදව් කරන්නා.

**9. ගොවිපළ සහ ගෘහ කළමනාකරණ උපදේශක**
කෘෂිකාර්මික හෝ ගෘහ ආර්ථික ක්‍රියාකාරකම්වල දි මිනිසුන්ට උපදෙස් ලබා දීම.

**10. උසස් අධ්‍යාපන ආයතන දේශක**
උසස් අධ්‍යාපන ආයතනවල විවිධ විෂයන්වලට අදාළව ඉගැන්වීමේ නිරත වීම.

**11. විශේෂ අධ්‍යාපන ගුරු**
අධ්‍යාපනික හෝ ශාරිරික ආබාධ සහිත සිසුන්ට මග පෙන්වීම.

**12. උපදේශන සම්බන්ධීකාරක**
විශේෂිත ක්ෂෙත්‍රවල ඉගැන්වීම ද්‍රව්‍ය සහ පාඨමාලා අන්තර්ගතය සංවර්ධනය කිරීම.

**13. පරිවර්තක**
එක් භාෂාවකින් තවත් භාෂාවකට තොරතුරු පරිවර්තනය කරන්නා.

**14. පෙර පාසල් ගුරු**
සමාජිය, ශාරීරික හා බුද්ධිමය වර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රියාකාරකම් සඳහා කුඩා දරුවන්ට උපදෙස් ලබා දීම.

**15. පුස්තකාලයාධිපති**
පුස්තකාලවල සම්පත් කලමනාකරණය කිරීම සහ අනුග්‍රාකයන්ට අපකාර කිරීම සඳහා සේවා ඉටු කිරීම.

**16. ගුරු සහායක**
සිසුන්ට ඉගැන්වීමේ දී ගුරුවරුන්ට සහය වීම.